# ඇබෑර්තු

## සහසර බස් සේවා නවීකරණ වැඩසටහන සඳහා
## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම
## ප්‍රවාහන අමාත්‍යාංශය

පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා, ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය යටතේ, "කොන්ත්‍රාත් පදනමින්", සුදුසුකම්ලත් හා කැපවී වැඩකළ හැකි ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | PS වර්ගීකරණය | තනතුර | තනතුරු ගණන | අදාළ වන චක්‍රලේඛය 01/2019 |
|---|---|---|---|---|
| 01 | PS-3 | ජ්‍යෙෂ්ඨ කළමනාකරු | 01 | MSD චක්‍රලේඛ අංක 01/2019 දිනය : 2019-03-15 (වෙබ් අඩවිය : www.treasury.gov.lk) |
| 02 | PS-4 | ප්‍රවාහන ඉංජිනේරු / ප්‍රවාහන පද්ධති විශ්ලේෂක | 02 | |
| 03 | PS-4 | ICT පද්ධති විශ්ලේෂක | 01 | |
| 04 | PS-4 | ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු | 01 | |
| 05 | PS-5 | ජ්‍යෙෂ්ඨ ප්‍රවාහන නිලධාරී | 01 | |
| 06 | PS-5 | ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී | 01 | |
| 07 | PS-5 | GIS නිලධාරී | 01 | |
| 08 | සහාය කාර්ය මණ්ඩලය | තාක්ෂණ සහකාර | 01 | රාජ්‍ය පරිපාලන සේවා චක්‍රලේඛ අංක 03/2016 වෙබ් අඩවිය : www.pubad.gov.lk |
| 09 | | කාර්යාල සහායක | 01 | |

එක් එක් තනතුරකට අදාළ වැටුප්, ඉහත චක්‍රලේඛය ප්‍රකාරව, වගුව 03 හි 03 තීරුවෙහි හා 04 උප තීරුවෙහි සඳහන් පරිදි වේ. (ව්‍යාපෘති පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 100 – 250 අතර වේ.) PS වර්ගීකරණයේ සියලුම තනතුරු සඳහා, ඇමුණුම I හි 5 තීරයෙහි සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය. ප්‍රවාහන අංශයේ කාර්ය පළපුරුද්ද, රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදුතාවය හා ඉහළ පරිගණක සාක්ෂරතාවය තිබීම වාසිදායක වනු ඇත.

| තනතුරු | පහත සඳහන් සුදුසුකම් සහිත අයවලුන්හට ප්‍රමුඛතාව හිමිවේ. |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු (PS3) | ● IT අංශයේ ව්‍යාපෘති කළමනාකරණ පළපුරුද්ද සමග IT පද්ධති ක්‍රියාත්මක කිරීමේ හා අනුකලනය කිරීමේ කාර්ය වාර්තාවක් තිබීම.<br>● ප්‍රවාහන අංග මෙහෙයුම්වල, නියාමන කළමනාකරණ සහ / හෝ ව්‍යාපෘති කළමනාකරණ පළපුරුද්ද,<br>● MS ව්‍යාපෘති හා ආශ්‍රිත මෙවලම් |
| ප්‍රවාහන ඉංජිනේරු / ප්‍රවාහන පද්ධති විශ්ලේෂක (PS4) | ● ප්‍රවාහන පද්ධති සැලසුම් සකස් කිරීම, මාර්ග තක්සේරු කටයුතු, ජංගමත්ව තක්සේරු කටයුතු, දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය<br>● ප්‍රවාහන සැලසුම් කිරීම් හා මෘදුකාංග නිෂ්පාදන ආකෘති නිර්මාණය පිළිබඳ පළපුරුද්ද / දැනුම<br>● පරිගණක පාදක විශ්ලේෂක මෙවලම් පිළිබඳ ප්‍රවීනතාවය / දැනුම |
| ICT පද්ධති විශ්ලේෂක (PS4) | ● මෘදුකාංග සංවර්ධන ජීව චක්‍ර (SDLC) පිළිබඳ පළපුරුද්ද.<br>● පද්ධති ක්‍රියාත්මක කිරීමේ හා අනුකලනය කිරීමේ පළපුරුද්ද.<br>● ව්‍යාපාර බුද්ධි (BI) මෙවලම් සම්බන්ධ පළපුරුද්ද. |
| ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු (PS4) | ● IT පද්ධති සංකලනය පිළිබඳ පසුගිය පළපුරුද්ද<br>● ජංගම සන්නිවේදන හා අන්තර්ජාල දේවල් (IOT)<br>● පරිගණක ජාලකරණ සන්නිවේදන කටයුතුවල දැනුම හා පළපුරුද්ද. |
| ජ්‍යෙෂ්ඨ ප්‍රවාහන නිලධාරී (PS5) | ● බස් අංශ නියාමන හා මෙහෙයුම් කළමනාකරණය පිළිබද පළපුරුද්ද<br>● ප්‍රවාහන සැලසුම් කිරීම්, අදාළ පාර්ශව කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සමග ප්‍රදර්ශනය කළ PR කුසලතා.<br>● පරිගණක පාදක විශ්ලේෂක මෙවලම් පිළිබඳ ප්‍රවීණත්වය. |
| ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී (PS5) | ● ශ්‍රී ලංකා රජයේ / විදේශ අරමුදල් සැපයු ව්‍යාපෘති පාදක ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය පිළිබඳ ප්‍රවීණතාවය.<br>● ප්‍රසම්පාදන / ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ විශේෂිත පුහුණුව ලබා තිබීම.<br>● පරිගණක පාදක විශ්ලේෂක මෙවලම් පිළිබඳ ප්‍රවීණත්වය. |
| GIS නිලධාරී (PS5) | ● සංකීර්ණ දත්ත සමුදය හා ස්ප්‍රෙඩ්ෂීට් භාවිතයේ හා ක්‍රියාකරවීමේ හැකියාව ඇතුළුව GIS හා සැලසුම් සේවා, IT නිපුණතා.<br>● Arc GIS හෝ ESRI ආදි විශේෂිත මෘදුකාංග පැකේජ පිළිබඳ දැනුවත්භාවය.<br>● දත්ත හා සංඛ්‍යාන විශ්ලේෂණ හැකියාව සමග සංඛ්‍යාංකමය නිපුණතා, සංඛ්‍යාංකණ තාක්ෂණය පිළිබඳ හුරුපුරුදු තාවය.<br>● ව්‍යාපෘති කළමනාකරණ නිපුණතා |
| තාක්ෂණ සහකාර (MN 02-III ශ්‍රේණිය) | **සුදුසුකම්** : අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල / දෙමළ / ඉංග්‍රීසි / ගණිතය හා තවත් විෂයයක් ඇතුළත්ව සම්මාන 3 සහිතව විෂයයන් 6 කින් සමත් වීම. සහ අ.පො.ස. (උ/පෙළ) විභාගය විෂයයන් 3 කින් සමත් වීම.<br>● ක්ෂේත්‍ර කාර්යවල පළපුරුද්ද. |
| කාර්යාල සහයක (PL 01-III ශ්‍රේණිය) | **සුදුසුකම්** : අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල / දෙමළ / ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව සම්මාන 2 සමග විෂයයන් 6 කින් සමත්වීම.<br>● සමාන තනතුරක පළපුරුද්ද. |

එක් එක් තනතුර සඳහා වෙන් වශයෙන් සකස් කළ අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත, 2021 අගෝස්තු 24 වන දිනට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**සහසර බස් සේවා නවීකරණ වැඩසටහන,**
**5 වන මහල, සෙත්සිරිපාය – අදියර I,**
**බත්තරමුල්ල,**

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මේ සම්බන්ධයෙන් යම් බලපෑම් සිදුකිරීම නුසුදුසුකමක් සේ සලකනු ඇත.

**ලේකම්,**
**ප්‍රවාහන අමාත්‍යාංශය,**
**දිනය : 2021-04-09**